# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2213/36 - 2021 පෙබරවාරි මස 03 වැනි බදාදා - 2021.02.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 10/2017 (III)

**2017 අංක 12 දරන විදේශ විනිමය පනත**

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය

2021 පෙබරවාරි මස 03 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1. මේ නියෝග 2021 අංක 3 දරන විදේශ විනිමය (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර 2021 මාර්තු මස 22 වන දින සිට ක්‍රියාත්මක විය යුතුය.

2.මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර ඇති ගනුදෙනුවලට අදාළව විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම, මේ නියෝගවල සහ මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, මේ පනතේ 4 වන වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති තාක් දුරට බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් සිදු කරනු ලැබීමට අවසර දෙනු ලැබූ, විදේශ විනිමයෙන් වූ බලයලත් ප්‍රාග්ධන ගනුදෙනු වර්ග විය යුතු ය.

3. මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී, සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පනතේ 9 වන වගන්තිය යටතේ, කලින් කලට, මහ බැංකුව විසින්, ඒ සම්බන්ධයෙන් කරනු ලබන විධාන වලට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

4. (1) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ නිරත වන සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම-

(අ) ගනුදෙනුව සිදු කරන තැනැත්තාගේ සද්භාවය; සහ

(ආ) එම ගනුදෙනුව මේ නියෝගවලට අනුකූල වන බව,

ඒ සම්බන්ධයෙන් වූ ලේඛනගත සාක්ෂි ලබා ගැනීම මගින් නිශ්චය කරගනු ලැබිය යුතු ය.

(2) මේ නියෝග යටතේ ප්‍රාග්ධන ගනුදෙනුවල නිරත වන සෑම තැනැත්තකු විසින් ම, (1) වන ඡේදයේ කාර්යය සඳහා යම් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු වෙත අවශ්‍ය සියලු ලේඛනගත සාක්ෂි සපයනු ලැබිය යුතු ය.

(3) මේ නියෝග යටතේ විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු සිදු කිරීමේ දී සෑම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් ම පූර්ණ නිසි උද්යෝගයෙන් යුතු ව ක්‍රියා කළ යුතු ය.

5.මේ නියෝග සමග අනුකූල වීමට අපොහොසත් වන යම් බලයලත් වෙළෙන්දකු, පරිසීමිත වෙළෙන්දකු හෝ බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් අවශ්‍ය වන බවට සලකනු ලැබිය හැකි යම් ක්‍රියාමාර්ගයක් ගනු ලැබිය යුතු ය.

6. (1) මේ නියෝගවල කාර්යය සඳහා "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් -

(අ) එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.);

(ආ) යූරෝ;

(ඇ) ස්ටර්ලිං පවුම්;

(ඈ) ඕස්ට්‍රේලියානු ඩොලර්;

(ඉ) සිංගප්පූරු ඩොලර්;

(ඊ) ස්වීඩන ක්‍රෝනර්;

(උ) ස්විස් ෆ්‍රෑන්ක්;

(ඌ) කැනේඩියානු ඩොලර්;

(එ) හොංකොං ඩොලර්;

(ඒ) ජපන් යෙන්;

(ඔ) ඩෙන්මාර්ක ක්‍රෝනර්;

(ඕ) නෝර්වීජියානු ක්‍රෝනර්;

(ක) චීන රෙන්මින්බි; සහ

(ග) නවසීලන්ත ඩොලර්,

අදහස් වේ.

(2) මහ බැංකුව විසින්, පනතේ 9 වන වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන විධාන මගින් කලින් කලට (1) වන ඡේදයේ නිශ්චිතව දක්වා ඇති නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

7.2017 නොවැම්බර් මස 17 වන දින අංක 2045/56 දරන *ගැසට් පත්‍රයේ* පළකරන ලද 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ සාදන ලද 2017 අංක 1 දරන විදේශ විනිමය (බලයලත් වෙළෙන්දන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමයෙන් වූ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග පරිච්ඡින්න කිරීම නොතකා, 2020 දෙසැම්බර් මස 18 වන දින අංක 2206/25 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය මගින් වලංගු කාල සීමාව දීර්ඝ කරන ලද, 2020 ජූලි මස 2 වන දින අංක 2182/37 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ කරන ලද නියමය, එසේ දීර්ඝ කරන ලද කාල සීමාව තුළ දී බලපැවැත්විය යුතු ය.

8. මේ නියෝගවල කාර්යය සඳහා -

"පනත" යන්නෙන්, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රාග්ධන ගනුදෙනුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මහ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"විගාමිකයා" යන්නෙන්,

(අ) වෙනත් රටක නිත්‍ය නේවාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති ශ්‍රී ලාංකිකයකු;

(ආ) මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලද ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසියකු; හෝ

(ඇ) (i) මව හෝ පියා ශ්‍රී ලංකාවේ උපත ලබා ඇති; සහ

(ii) සිය උපත ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති,

ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන තැනැත්තකු

අදහස් වන අතර, (අ), (ආ) සහ (ඇ) යන ඡේදවල සඳහන් තැනැත්තන්ගේ බාලවයස්කරුවන් ද ඇතුළත් වේ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ;

"සේවා නියුක්තයන්ගේ භාර අරමුදල" යන්නෙන් 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල අදහස් වේ;

"සමීපතම පවුල් සාමාජිකයන්" යන්නෙන්, අදාළ තැනැත්තාගේ දෙමව්පියන්, සීයා හෝ ආච්චි, සහෝදර සහෝදරියන් සහ කලත්‍රයා අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"අමාත්‍යවරයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මුදල් මණ්ඩලය" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමය" යන්නෙන්, යම් විදේශ රටක නිත්‍ය වාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති තැනැත්තකුගේ ශ්‍රී ලාංකික දෙමව්පියන්ට එම විදේශ රටේ නිත්‍ය වාසික තත්ත්වය ලබාගැනීමට හැකියාව ලබා දෙමින් එම විදේශ රට විසින් මෙහෙයවනු ලබන යෝජනා ක්‍රමයක් අදහස් වේ;

"ඉවත් කරන ලද විනිමය පාලන පනත" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ;

"පරිසීමිත වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"තාවකාලික නේවාසික වීසා" යන්නෙන්, නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත්ව, අනාගත දිනක දී එම රටේ නිත්‍ය වාසික තත්ත්වය හෝ පුරවැසිභාවය ලබාගැනීමට පුද්ගලයකුට හැකියාව ලබා දෙන්නා වූ වීසා වර්ගයකට අයත්වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු විසින් ලබාගන්නා ලද වීසා අදහස් වේ.

(2 වන නියෝගය).

**උපලේඛනය**

**I වන කොටස**

**විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම**

1. වයස අවුරුදු 18 හෝ ඊට වැඩි විගාමිකයකු මේ නියෝගවල සඳහන් කර ඇති සීමාවන්, නියම සහ කොන්දේසිවලට යටත්ව, ශ්‍රී ලංකා රුපියල්, විදේශ ව්‍යවහාර මුදල් බවට පරිවර්තනය වීමක් සිදුවන සංක්‍රමණික දීමනාවට හිමිකම් පෑමට සුදුසුකම් ලබයි.

2. (1) ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිය දී (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) විගාමිකයාට අයිතිව තිබූ හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර එම තැනැත්තාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම හරහා අරමුදල් භාවිත කර අත්පත් කරගත් හෝ උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි අත්පත් කරගත් ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(2) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකුගෙන් විගාමිකයාට උරුම වූ (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර, චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(3) ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු වන සමීපතම පවුල් සාමාජිකයකුගෙන් විගාමිකයකු ත්‍යාගයක් ලෙස ලබන (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වල හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(4) ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිය දී සිදුකරන ලද හෝ මේ නියෝග බලාත්මක වීමට පෙර ඔහුගේ හෝ ඇයගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් හරහා සිදු කරන ලද හෝ පැවරුම්කරු වෙත උරුමයෙන් ලද හෝ පැවරුම්කරු විසින් ත්‍යාගයක් ලෙස ලද හෝ උපලේඛනයේ මේ කොටසේ 8 වන ඡේදය යටතේ අවසර ලබා දී ඇති පරිදි සිදු කරන ලද ආයෝජනයන්ගෙන්, සමීපතම පවුල් සාමාජිකයකු වන වෙනත් විගාමිකයකුගෙන්, (එනම්, පැවරුම්කරු)විගාමිකයකු වෙත උරුම වූ හෝ ත්‍යාගයක් වශයෙන් ලැබුණු (පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ ආමුඛ ආයෝජන ගිණුම්වල ඇති අරමුදල් හැර, චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ යම් ලැබීම්වලින්;

(5) සමීපතම පවුල් සාමාජිකයකුගෙන් විගාමිකයා ලද (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපචිත වූ අරමුදල් වන මුදල් ත්‍යාගවලින්,

සංක්‍රමණික දීමනාවට හිමිකම් කියනු ලැබිය යුතු ය.

3. මේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සංක්‍රමණික දීමනාව සඳහා පහත දැක්වෙන සීමාවන් අදාළ විය යුතු ය -

(1) විගාමිකයකු සඳහා එ.ජ.ඩො. 200,000 බැගින්වූ ආරම්භක සංක්‍රමණික දීමනාවක්,

(2) එ.ජ.ඩො. 30,000ක වාර්ෂික සංක්‍රමණික දීමනාවක්; ආරම්භක සංක්‍රමණික දීමනාව සම්පූර්ණයෙන් භාවිත කිරීමෙන් මාස 12ක අවම කාලයක් ඉකුත් වීමෙන් පසුව එකී පළමු වාර්ෂික දීමනාව පැවරිය හැකි ය. පළමු වාර්ෂික දීමනාව හැර පසුව වන දීමනා ලිත් වර්ෂයක් පාසා පවරනු ලැබිය යුතු අතර, (පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම කාල සීමාව සඳහා බැංකු ගිණුමක් වෙත අරමුදල් බැර කර පවත්වාගෙන ගොස් ඇත්නම්) එකතු කොට පැවරීම සිදු කරනු ලැබිය හැකි ය.

(3) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ආරම්භක සංක්‍රමණික දීමනාවේ කොටසකට හිමිකම් පෑම සිදු කර ඇති විගාමිකයකු සඳහා එ.ජ.ඩො. 150,000හි ඉතිරිය සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයේ (2) වන අනුඡේදයේ සඳහන් කර ඇති පරිදි වන එ.ජ.ඩො. 30,000ක පසුව ගෙවනු ලබන වාර්ෂික දීමනාව;

(4) 2017 නොවැම්බර් මස 20 වන දිනට පෙර ආරම්භක සංක්‍රමණික දීමනාව සම්පූර්ණයෙන් ම භාවිත කර ඇති විගාමිකයකු සඳහා 2013, 2014, 2015 සහ 2016 වර්ෂ සඳහා ලිත් වර්ෂයකට එ.ජ.ඩො. 20,000ක් බැගින් වූ සමුච්ඡිත වාර්ෂික දීමනාවක් සහ උපලේඛනයේ මේ කොටසේ 3 වන ඡේදයේ (2) වන අනුඡේදයේ සඳහන් කර ඇති පරිදි වන එ.ජ.ඩො. 30,000ක පසුව ගෙවනු ලබන වාර්ෂික දීමනාව.

4. විගාමිකයකු විසින් ශ්‍රී ලංකාවේ නේවාසිකයකුව සිටිමින් එකී පුද්ගලයා විසින් නිත්‍ය වාසිකත්වය හෝ පුරවැසිභාවය ලබාගෙන ඇති රටේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදුකරන ලද මුළු ආයෝජනවල වටිනාකම, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන අවස්ථාවේ දී, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවෙන් අඩුකරනු ලැබිය යුතු ය.

5. විදේශ රටවල් විසින් මෙහෙයවනු ලබන "මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රම" සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එකී පුද්ගලයන් විසින් වීසා ලබාගැනීම සඳහා විදේශ අධිකාරීන්ට සිදු කිරීමට ඇති ගෙවීම් සඳහා වන අරමුදල්, පනතේ විධිවිධාන යටතේ මහබැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, එකී පුද්ගලයන් විසින් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් හරහා ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය. එකී ගෙවීම සිදු කරනු ලැබූ රට තුළ නිත්‍ය වාසිකත්වය ලැබීමෙන් පසුව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන අවස්ථාවේ දී එකී පුද්ගලයාගේ සුදුසුකම් ලත් සංක්‍රමණික දීමනාවෙන්, එම ගෙවීම්වල එකතුව අඩු කරනු ලැබිය යුතු ය.

6. ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති වයස අවුරුදු 18 හෝ ඊට වැඩි ශ්‍රී ලාංකික පුද්ගලයකු, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එ.ජ.ඩො. 30,000ක උපරිමයක් සඳහා හිමිකම් පෑම සිදු කරනු ලැබිය හැකි ය. එම තැනැත්තන් විසින් විවෘත කරන ලද ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් හරහා එකී දීමනාව සඳහා හිමිකම් පානු ලැබිය හැකි ය. සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන අවස්ථාවේ දී සුදුසුකම් ලැබූ සංක්‍රමණික දීමනාවෙන් එසේ හිමිකම්පාන ලද ප්‍රමාණය අඩු කරනු ලැබිය යුතු ය.

7. ආපසු සියරට යැවීමේ ක්‍රමය -

(1) උපලේඛනයේ මේ කොටසේ 5 වන සහ 6 වන ඡේද යටතේ නිශ්චිතව දක්වා ඇති විගාමිකයන් හෝ තැනැත්තන් විසින් සුදුසුකම්ලත් දීමනා ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, බැංකු පද්ධතිය තුළ එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(2) උපලේඛනයේ මේ කොටසේ 7(4) වන අනුඡේදයේ දක්වා ඇති විගාමිකයකුගේ ආදායම ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා ඔහුට හෝ ඇයට වෙනම ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාමට අවශ්‍ය නම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව එම කාර්යය සඳහා ම එම තැනැත්තා විසින් බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමග එක් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් පමණක් විවෘත කර පවත්වාගෙන යනු ලැබිය හැකි ය. එසේ වුව ද, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම යන දෙකම එකම බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දා සමග විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) සංක්‍රමණික දීමනාව විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් ඉල්ලුම්කරුගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමට හෝ ආමුඛ ආයෝජන ගිණුමට හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකයක ගිණුමකට හෝ විගාමිකයාගේ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමකට මාරුකරනු ලැබිය හැකි ය.

(4) උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදයේ දක්වා ඇති යම් වත්කම්වලින් උපචිත වන යම් ආදායමක් සහ (සේවක අර්ථසාධක අරමුදල (EPF), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ETF), පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් යම් විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විශ්‍රාම ප්‍රතිලාභ අවස්ථාවෝචිත පරිදි අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමට හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමට හෝ අනේවාසික රුපියල් ගිණුමට බැර කරනු ලැබිය හැකි අතර, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් නොවී, විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යැවිය යුතු ය. එම අරමුදල් විගාමිකයාගේ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමෙන් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමෙන් විගාමිකයාගේ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ආමුඛ ආයෝජන ගිණුමකට හෝ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක අක්වෙරළ බැංකු ඒකකයක ගිණුමකට හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ගිණුමකට මාරු කරනු ලැබිය හැකි ය.

8. විගාමිකයන් විසින් ශ්‍රී ලංකාවේ දරනු ලබන අරමුදල් වලින් කරනු ලබන ආයෝජන

(1) විගාමිකයකුට, එම විගාමිකයාගේ අනේවාසික රුපියල් ගිණුමේ ඇති අරමුදල්වලින්, 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/35 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග යටතේ අවසර ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකාව තුළ ආයෝජන සිදු කිරීමට අවසර ඇත.

(2) එම ආයෝජනවල සම්පූර්ණ ආදායම සහ ප්‍රාග්ධන ඉපැයුම්, ආයෝජනය සිදුකරන ලද අදාළ අනේවාසික රුපියල් ගිණුම්වලට බැරකරනු ලැබිය යුතු ය.

(3) එම ආයෝජනවල සම්පූර්ණ ආදායම පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට අනුව, සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත් නොවී, විගාමිකයාගේ අදාළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය යුතු ය.

(4) එම ආයෝජනවල යම් ප්‍රාග්ධන ලැබීම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවල නිශ්චිතව දක්වනු ලැබිය හැකි පරිදි සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාවට යටත්ව, ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම හරහා පමණක් ආපසු සියරට යවනු ලැබිය හැකි ය.

9. විගාමිකයකු විසින්, ඔහු විසින් ශ්‍රී ලංකාවේ දරන ශ්‍රී ලංකා රුපියල් භාවිතයෙන් මිල දී ගනු ලැබූ හෝ උරුමයෙන් ලද නිශ්චල දේපළක් ශ්‍රී ලංකාවේ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික යම් තැනැත්තකුට විකුණන අවස්ථාවක දී, එම දේපළ විකිණීමට අදාළ ප්‍රතිෂ්ඨාව ගෙවීම ශ්‍රී ලංකා රුපියල්වලින් සිදුකළ යුතු අතර, එය විගාමිකයාගේ අනේවාසික රුපියල් ගිණුමකට හෝ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමකට පමණක් බැරකරනු ලැබිය යුතු ය.

10. වෙනත් නියම සහ කොන්දේසි.

(1) විගාමිකයකු විසින් ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරවම පදිංචිවීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරන විට දී, එකී පුද්ගලයාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුම්, අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ සංක්‍රමණය සම්බන්ධයෙන් ඔහු හෝ ඇය ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දාට දැනුම් දෙනු ලැබිය යුතු ය. දැනටමත් විගාමිකයකු වන පුද්ගලයකු විසින් මේ නියෝග ක්‍රියාත්මක වීමෙන් මාස 6ක් ඇතුළත එසේ කිරීමට කටයුතු කළ යුතු ය.

(2) සංක්‍රමණික දීමනාවට, ශ්‍රී ලංකාව හැරයන අවස්ථාවේ දී (පළමුව හෝ පසුව) හෝ ශ්‍රී ලංකාවෙන් පිටත විගාමිකයා නේවාසිකව සිටින අවස්ථාවේ දී පමණක් හිමිකම් පෑම සිදුකළ යුතු ය.

## II වන කොටස

පනත ක්‍රියාත්මක වීමට පෙර ප්‍රදානය කර ඇති යම් (සාමාන්‍ය හෝ විශේෂ) අනුමැතියක් යටතේ සිදු කරනු ලබන සහ මේ නියෝගවල නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලට සාරානුකූලව සමාන වන්නා වූ දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු, මේ නියෝග මගින් හෝ යම් පසුකාලීන නියෝග මගින් විශේෂයෙන් වෙනස් කරනු ලබන්නේ නම් මිස එම අනුමැතිය යටතේ එම ගනුදෙනු සඳහා නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසිවලට යටත්ව අඛණ්ඩව සිදු කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### ගිණුම් නැවත නම් කිරීම ආදිය

1. මහ බැංකුව විසින් ලියාපදිංචි කිරීමේ අංකයක් නිකුත් කර ඇති ගිණුම් හැර සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, මේ නියෝග ගැසට් පත්‍රයේ පළ කරන ලද දිනයේ සිට මාස තුනක් ඇතුළත අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කරන ලද විදේශ ආයතන සහ සමාගම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විදේශයන්හි සේවා නියුක්ත ශ්‍රී ලාංකිකයන් විසින් පවත්වාගෙන යනු ලබන දැනට පවතින සියලු ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්,

පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන විධානවලට යටත්ව, මේ නියෝග *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දින සිට මාස 3 ක් ඇතුළත, පිළිවෙළින් අනේවාසික රුපියල් ගිණුම් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

3. ඔහු හෝ ඇය නිත්‍ය වාසිකත්වය ලබාගත් රටේ ස්ථිරව ම පදිංචි වීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාව හැරයාමට අදහස් කරනු ලබන විගාමිකයකු විසින් පවත්වාගෙන යනු ලබන සියලු ශ්‍රී ලංකා රුපියල් ගිණුම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන යම් විධානයකට යටත්ව, එම විගාමිකයාගේ සංක්‍රමණය පිළිබඳව බලයලත් වෙළෙන්දා හෝ පරිසීමිත වෙළෙන්දකු දැනගත් මොහොතට ඉක්බිතිව ම බලාත්මක වන පරිද්දෙන් අනේවාසික රුපියල් ගිණුම් ලෙස නැවත නම් කර තවදුරටත් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

4. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා විසින් නිකුත් කරන ලද ලියාපදිංචි කිරීමේ අංකය සමඟ දැනටමත් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කර ඇති විගාමිකයන්ගේ නමින්, පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරන ලද යම් විධානයකට යටත්ව, විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසරය ඇත.

## **IV** වන කොටස

### ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමේ බලය.

1. ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම්

මේ නියෝග යටතේ නිශ්චිතව දක්වා ඇති ප්‍රාග්ධන ගනුදෙනුවලදී ගනුදෙනු කිරීමට පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නමින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(1) ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විගාමිකයකු;

(2) බාලවයස්කරුවකු ද ඇතුළුව ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික විජාතිකයකු;

(3) වයස අවුරුදු 18 හෝ ඊට වැඩි වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ වෙනත් රටකට පිටත් වීමට අදහස් කරනු ලබන ශ්‍රී ලාංකික පුද්ගලයකු;

(4) මාපිය සංක්‍රමණ යෝජනා ක්‍රමයක් යටතේ අනාගත සංක්‍රමණිකයකු වන ශ්‍රී ලාංකික පුද්ගලයකු;

(5) ඉහත (1) සහ (2) අනුඡේදවල සඳහන් තැනැත්තකු මියගියහොත්, එම තැනැත්තාගේ බූදලය අද්මිනිස්ත්‍රාසි කර අවසන් වන තෙක් එම මියගිය තැනැත්තාගේ බූදලයේ අද්මිනිස්ත්‍රාසිකරු හෝ පොල්මෑකරු;

(6) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග.

2. විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම්

යම් විගාමිකයකු විසින් ගෝලීය වශයෙන් උපවය කරගන්නා ලද වර්තමාන ආදායම හඳුනාගැනීම සඳහා එම විගාමිකයා ස්ථිර වශයෙන් නේවාසිකව සිටින රටේ නියාමන අවශ්‍යතාවයක් පවතින්නේ නම් පමණක්, මේ උපලේඛනයේ 1 වන කොටසේ 7(4) වන අනුඡේදයේ සඳහන්, ශ්‍රී ලංකාව තුළ උපවය වූ ඔහුගේ හෝ ඇයගේ වර්තමාන ආදායම ආපසු සියරට යැවීමේ කාර්යය සඳහා පහත දැක්වෙන සුදුසුකම්ලත් තැනැත්තන්ගේ නාමයෙන් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් විවෘත කර පවත්වාගෙන යෑම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට බලය තිබිය යුතු ය -

(අ) විගාමිකයකු;

(ආ) මහ බැංකුව විසින් කලින් කලට බලය ලබා දිය හැකි වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් වර්ග;

3. අනේවාසික රුපියල් ගිණුම්

මේ නියෝගවල මේ උපලේඛනයේ I වන කොටසේ 8 වන ඡේදයේ දක්වා ඇති ශ්‍රී ලංකාවේ දේශීය ගනුදෙනු සහ අවසරලත් ආයෝජනවලට පහසුකම් සැලසීම සඳහා, කලින් කලට සංශෝධනය කරනු ලැබිය හැකි පරිදි වන 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/38 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග ප්‍රකාරව විගාමිකයන් සඳහා අනේවාසික රුපියල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙන්දකුට හෝ පරිසීමිත වෙළෙන්දකුට අවසර ලබා දෙනු ලැබේ.

4. වෙනත් නියම සහ කොන්දේසි

(1) මේ උපලේඛනයේ මේ කොටසේ 1 වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළ එක් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුමක් පමණක් විවෘත කරනු ලැබිය යුතු ය.

(2) මේ උපලේඛනයේ මේ කොටසේ 2 වන ඡේදය යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි යම් සුදුසුකම්ලත් තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය තුළ එක් විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුමක් පමණක් විවෘත කරනු ලැබිය යුතු ය.

(3) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම සහ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම යන ගිණුම් දෙකම එකම බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(4) ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා වන නිර්ණායක, එම ගිණුම් සඳහා අවසර ලත් හර කිරීම්, බැර කිරීම් පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන අදාළ විධානවල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(5) උපලේඛනයේ මේ කොටස යටතේ නිශ්චිතව දක්වා ඇති ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා ඉල්ලා සිටින තැනැත්තන්, මේ නියෝග සහ පනතේ විධිවිධාන යටතේ මහ බැංකුව විසින් කලින් කලට නිකුත් කරනු ලබන විධාන ප්‍රකාරව එම ගිණුම් විවෘත කර පවත්වාගෙන යාම සඳහා සුදුසුකම් සහිත තැනැත්තන් වන බවට නිශ්චය කර ගැනීම සඳහා බලයලත් වෙළෙන්දකු හෝ පරිසීමිත වෙළෙන්දකු විසින් නිසි උද්යෝගයෙන් සහ සාධාරණ සැලකිල්ලෙන් යුතුව කටයුතු කරනු ලැබිය යුතු ය. සෑම බලපත්‍රලාභී වෙළෙන්දකුම හෝ පරිසීමිත වෙළෙන්දකු ම විසින් ගිණුම පවත්වාගෙන යන කාලය අතරතුර සහ එම ගිණුම් වසා දැමීමෙන් අවම තරමේ අවුරුදු හයක කාලයක් සඳහා ගිණුම් හිමියන් සුදුසුකම් සහිත බවට තහවුරු කිරීමේ සාක්ෂියක් ලෙස ගිණුම් හිමියාට අදාළ තොරතුරු සහ ලිඛිත සාක්ෂි පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

02 - 379

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.